**ඉතිහාසය - 12 ශ්‍රේණිය**

**ශ්‍රී ලංකාවේ ඉතිහාසය - 3 හා 5 වන පාඩම්**

**දයාබර දූවේ පුතේ,**

ඓතිහාසික මූලාශ්‍ර විචාරශීලිව විමර්ශනය කිරීමට ඔබට හැකියාව ඇති බව අප දන්නා කරුණකි. එසේම රජරට ශිෂ්ටාචාරයේ පදනම දුර්වල වීමෙන් එහි පරිහානිය හා බිඳවැටීම සිදුවූ ආකාරය පිළිබඳව පැහැදිලි කිරීමට ද ඔබට හැකි බව අපගේ විශ්වාසයයි. එබැවින් ඔබගේ විෂය නිර්දේශයේ එන 03 වන හා 05 වන පාඩම් වලට අදාළ සටහන් නැවත කියවා පහත ප්‍රශ්න සියල්ලටම පිළිතුරු ලිවීමට උත්සාහ කරන්න. ඔබට ජය නියතයි.

01) මහසෙන් රජුගේ පාලන සමයේ අවසානය දක්වා ශ්‍රී ලංකාවේ දේශපාලන ඉතිහාසය හැදෑරීමේදී ඓතිහාසික මූලාශ්‍රයක් වශයෙන් මහාවංශය වැදගත්වන ආකාරය පහත මාතෘකා යටතේ පරීක්ෂා කරන්න.

i. මහාවංශයේ කර්තෘත්වය හා රචිත කාල වකවානුව (ල.02)
ii. මහාවංශයේ දැක්වෙන සිද්ධීන් අභිලේඛන මූලාශ්‍ර මඟින් සනාථ වීම (ල.06)
iii. මූලාශ්‍රයක් වශයෙන් මහාවංශයේ දුර්වලතා (ල.06)

02) අනුරාධපුර රාජධානිය පරිහානියට හා බිඳවැටීමට බලපෑ හේතු පැහැදිලි කරන්න. (ල.14)